මොරටුව විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

පුරප්පාඩු

මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. වැඩ සහායක (III ශ්‍රේණිය)

සුදුසුකම්	:	අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.
වයස	:	අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
වෙනත්	:	(i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය. (ii) තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය. (iii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
**වැටුප් ක්‍රමය	:	U-PL1 (III) රු. 42,775 -16x450 -49,975/- (මාසික) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025 (i) අනුව වැටුප් ගෙවනු ලැබේ.
බඳවා ගන්නා ක්‍රමය	:	වෘත්තීය පරීක්ෂණයක් සහ/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණක් මඟින්

02. පශ්චාත් මරණ පරීක්ෂණ කම්කරු (III ශ්‍රේණිය)

සුදුසුකම්	:	අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිට තිබිය යුතුය.
වයස	:	අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
වෙනත්	:	(i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය. (ii) තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය. (iii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
**වැටුප් ක්‍රමය	:	U-PL1 (III) රු. 42,775 -16x450 -49,975/- (මාසික) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025 (i) අනුව වැටුප් ගෙවනු ලැබේ.
බඳවා ගන්නා ක්‍රමය	:	වෘත්තීය පරීක්ෂණයක් සහ/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණක් මඟින්

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

සම්පූර්ණ කරන ලද අයදුම්පත්, සහතික කරන ලද සහතිකවල පිටපත් ද සහිතව 2026.12.07 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ සහකාර ලේඛකාධිකාරි/ආයතන (අනධ්‍යයන) මොරටුව විශ්වවිද්‍යාලය, මොරටුව වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්පත් මොරටුව විශ්වවිද්‍යාලයේ https://uom.lk/vacancies වෙබ් අඩවිය මඟින් බා ගත කල හැක. ගැටළු ඇතිවුවහොත් 011- 2640511 දුරකථන අංකය අමතන්න.

උසස් අධ්‍යාපන ආයතනයන්හි, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් එවීමට කටයුතු කළ යුතු වේ.

ඉහත පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවනු නොලබන, ප්‍රමාද වී ලැබෙන හෝ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බව කරුණාවෙන් සලකන්න.

අදාළ තනතුරු සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටිවලට අනුකූලව බඳවා ගැනීමේ ක්‍රියාවලිය සහ තෝරා ගැනීම් සිදු කිරීමේ අයිතිය මොරටුව විශ්වවිද්‍යාලය සතු වේ.

ලේඛකාධිකාරි
මොරටුව විශ්වවිද්‍යාලය
මොරටුව.
2026.11.17

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED